# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1998 අංක 25 දරන කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 මැයි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1998 මැයි මස 22 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 5.75 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

**1998 අංක 25 දරන කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1998 මැයි මස 21 වන දින]

එල්.ඩී.—ඕ. 4/94.

**කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

වර්ෂ 1873 අගෝස්තු මාසයේ පැවැත්වුන "පානදුරා වාදය" තුළින් පැතිරී ගිය බෞද්ධ ධර්මය පිළිබඳ පණිවුඩයෙන් පෙළඹවනු ලැබූ පරමවිඥානාර්ථවාදියකු වූ ඇමරිකන් ජාතික සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට් සහ රුසියානු ග්‍රන්ථ කර්තෘවරියක සහ පරමවිඥානාර්ථවාදිනියක වූ හෙලේනා පී. බ්ලැවැස්කි 1880 මැයි මස 17 වන දින ශ්‍රී ලංකාවට පැමිණ ප්‍රසිද්ධියේ ම තිසරණ සහිත පන්සිල් සමාදන්ව බෞද්ධයන් වූ හෙයින් ද : පූර්විකාව.

ඒ අවධියේ දී පිරිහුණු තත්වයක තිබුණු ජාතික අභිමානය නංවාලීමේ අවශ්‍යතාව දුටු එම පරමවිඥානාර්ථවාදීන් අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, අතිපූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි හා අනගාරික ධර්මපාල වැනි බෞද්ධ නායකයන් හා එක්ව අධ්‍යාපනය, සංස්කෘතිය හා ජාතික උරුමය ගොඩනැංවීමේ අභිලාශයෙන් හා සම්බුද්ධ ශාසනය රැකගැනීම සඳහා කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටවාලූ හෙයින් ද :

ඒ සමාගම ප්‍රසිද්ධ පාඨශාලා 420ක් ම පරිපාලනය කර තිබෙන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 25 දරන කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමිතියෙහි දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් "කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමිතිය" යන නාමය හා

කොළඹ පරමවිඥානාර්ථ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම.

2—D 042697—5,900 (97/01)

අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද, එකී නාමයෙන් එම සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද සියලු අධිකරණයන්හි නඩු පැවරීමට හා පවරනු ලැබීමට හැකි වන අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, භාවිත කිරීමට ද අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය එම සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වේ :—

(අ) සම්බුද්ධ ශාසනය පෝෂණය කිරීම හා වර්ධනය කිරීම හා දහම් පාසැල්, අභිධර්ම හා පාලි ඉගැන්වීමේ මධ්‍යස්ථාන ඇති කිරීමෙන් පවත්වාගෙන යාමෙන් සහ දේශන, වැඩසටහන්, සම්මන්ත්‍රණ, විවාද සහ වැඩමුළු ආදිය සංවිධානය කිරීමෙන් බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම ;

(ආ) බහුශ්‍රැත, ධර්මධර භික්ෂූන් වහන්සේලා ඇති කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම හා සුදුසු දරුවන් පැවිදි කිරීම:

(ඇ) බෞද්ධ සංස්කෘතිය, සාහිත්‍යය සහ කලා ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම ;

(ඈ) බෞද්ධයන්ගේ සදාචාරාත්මක, සංස්කෘතික හා සාමාජික සංවර්ධනය ඇති කිරීම සහ බෞද්ධයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ;

(ඉ) අනාථ හා වැඩිහිටි නිවාස ඇතිකොට පවත්වාගෙන යාම, ජල ගැල්ම, සුළිසුළං, වසංගත සහ වෙනත් ව්‍යසනයන්ගෙන් පීඩිත වූවන්ට ආධාර සැලසීම ;

(ඊ) දේශීය හා විදේශීය වන්දනාකරුවන් සඳහා විශ්‍රාම ශාලා පවත්වාගෙන යාම සහ වෙනත් සමාජ සේවා හා සුභසාධක කටයුතු සංවිධානය කිරීම ;

(උ) සංස්ථාවේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා පෙර පාසැල්, වෙනත් අධ්‍යාපනික ආයතන හා පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම සහ මුදල් ආධාර සහ ශිෂ්‍යත්ව ප්‍රදානයන් හා වෙනත් ළමා අධ්‍යාපන හා සංවර්ධන කටයුතුවලට පහසුකම් සැලසීම ;

(ඌ) පුස්තකාල පිහිටුවීම හා සංස්ථාවේ පරමාර්ථවලට අදාළ පොත් පත්, සඟරා ආදිය මුද්‍රණය කිරීම, පළ කිරීම හා විකිණීම ;

(එ) ජාතිය, ආගම, ස්ත්‍රී-පුරුෂත්වය, කුලය හෝ වර්ණය වශයෙන් භේදයක් නොමැතිව විශ්ව සහෝදරත්වය ප්‍රවර්ධනය කිරීමේ කේන්ද්‍රස්ථානයක් ගොඩනැංවීම ;

(ඒ) ආගම්, දර්ශන හා විද්‍යාවන් තුලනාත්මකව හැදෑරීම සඳහා ධෛර්යය දීම ;

(ඔ) විශ්ව සාමය ගොඩනැඟීමට සහාය වීම : සහ

(ඕ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ල හෝ ඉන් කිසිවක් හෝ මුදුන් පමුණුවා ගැනීම සඳහා ආනුෂංගික හෝ ඉවහල් වන්නා වූ අනෙකුත් සියලුම ක්‍රියා සහ දේ කිරීම.

**4.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතුව හෝ නැතුව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදාන සහ පරිත්‍යාග ලබා ගැනීමේ හෝ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහකිරීමේ බලය ද ඇතුළුව සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය මේ පනත සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ධුර දරන්නන් සහ සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒ රීති අනුව තෝරා පත් කර ගනු ලබන වෙනත් යම් තැනැත්තන්ගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විධායක කාරක සභාවේ ධුර දැරුවා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

**6.** (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය–

සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම :

(ආ) ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන්ගේ ධුර හිස් කිරීම හෝ ඔවුන් ධුරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල හා කාර්ය:

(ඇ) විධායක කාරක සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ එහි බලතල චර්යාව හා කාර්ය:

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ චර්යාව, භාරකාර වරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය :

(ඉ) සංස්ථාවේ කාරක සභාවේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන දිනය, ස්ථානය, ඒ පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර හා ඒ රැස්වීම්වල ගණපූරණය, යන කටයුතු කරගෙන යාම :

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ ඒවා විගණනය කිරීම:

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුනුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලපැවැත් වූ සමිතියේ රීති මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින සමිතියේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සමිතියට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සමිතියට ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය.

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක් තෑගි, කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට හැකිවන අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයා භාරයේ තැබිය යුතු ය. තවද ඒ ලේකම්වරයා ද සභාපතිවරයා හෝ භාණ්ඩාගාරික වරයා යන දෙදෙනාගෙන් එක් අයකු ද ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් ඉදිරිපිට දී මුද්‍රාව තැබූ බවට ලකුණක් වශයෙන් ඔවුන් එකී සාධන පත්‍රයෙහි තම අත්සන් තැබිය යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර ශ්‍රී ලංකා ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.